# සංක්ෂිප්තය

මූලික පිරිවෙන්වල සම්භාව්‍ය භාෂා අධ්‍යයන ක්‍රියාවලිය සංවර්ධනයට ගුරු උපදේශකවරුන්ගෙන් ලැබෙන දායකත්වය විමර්ශනය කිරීම, මෙම අධ්‍යයනයේ අභිමතාර්ථය විය. ජාතික අධ්‍යාපන ආයතනයේ සම්භාව්‍ය භාෂා පිළිබඳ ව්‍යාපෘති ප්‍රධානියා වූ මෙම පර්යේෂකයා විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපනපති සාමාන්‍ය (අර්ධ කාලීන) පාඨමාලාවේ පර්යේෂණ අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා තම විෂයක්ෂේත්‍රයට අදාළ පරිදි මෙම මාතෘකාව තෝරා ගන්නා ලදි. පිරිවෙන් ගුරු උපදේශක සේවාව පිළිබඳ මෙතෙක් කිසිදු විධිමත් අධ්‍යයනයක් සිදු වී නොමැති බැවින්, කාලීන අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීමේ අරමුණෙන් මෙම මාතෘකාව තෝරා ගන්නා ලදි. මෙම අධ්‍යයනයේ දී, මූලික පිරිවෙන්වල සම්භාව්‍ය භාෂාවන්ගේ පවත්නා වර්තමාන සාධන තත්ත්වය හඳුනා ගැනීම, මූලික පිරිවෙන්වල සම්භාව්‍ය භාෂා අධ්‍යයනය සංවර්ධනයට ගුරු උපදේශකවරුන්ගෙන් ලැබෙන සහාය සොයා බැලීම, සම්භාව්‍ය භාෂාවන්ගේ සංවර්ධන ක්‍රියාවලිය තුළ හඳුනාගත් ගැටලු විමර්ශනය කිරීම, සම්භාව්‍ය භාෂා අධ්‍යයන ක්‍රියාවලියේ සංවර්ධනය සඳහා ගුරු උපදේශකවරුන් හා ගුරුවරුන් යෝජනා කරන ක්‍රියාමාර්ග විමසා බැලීම යන කරුණු හතර පර්යේෂණ අරමුණු ලෙස පිහිටුවා ගන්නා ලදි.

අධ්‍යයන මාතෘකාවට අදාළ ව න්‍යායාත්මක තොරතුරු හා දේශීය - විදේශීය වශයෙන් සිදු කර ඇති පර්යේෂණ සාහිත්‍ය තොරතුරු ද ඉදිරිපත් කර ඇත. මෙම අධ්‍යයනය සඳහා බස්නාහිර පළාතේ මූලික පිරිවෙන් 45ක සම්භාව්‍ය භාෂා උගන්වන ගුරුවරුන් 90 දෙනෙක් ද, පාලි - සංස්කෘත විෂය දෙක සඳහා පත්ව සිටින දිවයිනෙහි සියලු ම ගුරු උපදේශකවරුන් ද (18කි) පරිවේනාධිපතිවරුන් නවදෙනෙකු ද (පිරිවෙන් නියැදියෙන් සියයට විස්සක්) අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් දෙපාර්තමේන්තුවේ විෂය උපදේශකවරුන් දෙදෙනා ද ඇතුළු ව 119 දෙනෙකු යොදා ගන්නා ලදි. එසේ ම අධ්‍යාපන පර්යේෂණ සඳහා බහුල ව භාවිත වන විස්තරාත්මක පර්යේෂණ ක්‍රමයේ ප්‍රවර්ගයක් වන සමීක්ෂණ ක්‍රමය මෙහි දී භාවිත කළ අතර ඒ යටතේ ලේඛන විශ්ලේෂණය හා ප්‍රශ්නාවලී භාවිතය මගින් දත්ත රැස්කරගන්නා ලදි. එම ප්‍රමාණාත්මක දත්තවලින් මතු වූ රටා පැහැදිලි කිරීමටත් දත්ත ත්‍රිකෝණීකරණය කිරීමටත් නාභිගත සම්මුඛ සාකච්ඡා මගින් ලබා ගත් ගුණාත්මක දත්ත, භාවිත කරන ලදි. විවිධ ක්‍රමවේද ඔස්සේ රැස් කර ගන්නා ලද දත්ත විශ්ලේෂණය කිරීමේ දී අරමුණුවලට අදාළ ව කරුණු රැසක් අනාවරණය විය.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයේ අනිවාර්ය හා ප්‍රධාන වූ විෂයන් දෙකක් වන පාලි හා සංස්කෘත භාෂා (සම්භාව්‍ය භාෂා) අධ්‍යාපනය ඉතා වේගයෙන් පිරිහෙමින් තිබෙන බව අනාවරණය විය. වසර 20 කට වඩා පැරැණි විෂය නිර්දේශයක් ක්‍රියාත්මක වීමත් ඒවායේ විෂය පරාසය පුළුල් වීමත් මෙම පිරිහීමට ප්‍රධාන හේතුවක් බව අනාවරණය විය. මෙම විෂයයන් පිළිබඳ ව බලධාරින්ගේ සැලකිල්ල හා අවධානය නොමැති වීමෙන්, නවීන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද ඔස්සේ නූතනයට ගැළපෙන පරිදි ප්‍රතිසංවිධානයක් නොවීම මත ගුරුවරයාටත් ශිෂ්‍යයාටත් අප්‍රිය වූ විෂයන් බවට පත් වී ඇති බව ද අනාවරණය විය. එසේ ම විෂය සංවර්ධනය සඳහා සිටිය යුතු ගුරු උපදේශකවරුන්ගෙන් සියයට 50ක් ම පුරප්පාඩු වී ඇති අතර දැනට සිටින ගුරු

උපදේශකවරුන් කිහිපදෙනා ද විධිමත් ක්‍රමයකට බඳවා ගත් පිරිසක් නොවන බව අනාවරණය විය. ඔවුන්ට අත්දැකීම් හෝ නිසි පුහුණුවක් හෝ නොමැති බව ද සනාථ විය. තව ද ගුරු උපදේශකවරුන් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් පිළිබඳ ව ගුරුවරුන්ගේ කිසිදු ප්‍රසාදයක් නොමැති අතර අන්‍යෝන්‍ය සුහද බවක් ද ඔවුනොවුන් අතර නොමැති බව අනාවරණය විය. පිරිවෙන් ගුරු උපදේශකවරුන් ඉතාමත් අසහනකාරී පරිසරයක් තුළ රාජකාරි කරන බවත් ඔවුන්ට බොහෝ ගැටලු ඇති බවත් ඒවා විසඳා ගැනීමට පද්ධතියේ ඉහළ නිලධාරීන්ගෙන් කිසිදු සහායක් හෝ රජයෙන් කිසිදු පහසුකමක් හෝ නොලැබෙන බවත් අනාවරණය විය.

පිරිවෙන්වල භෞතික පහසුකම් පිළිබඳ ගැටලු ද ශිෂ්‍යයන් පිළිබඳ ගැටලු ද ගුරුවරුන් පිළිබඳ ගැටලු ද මෙම අධ්‍යයනයේ දී අනාවරණය වූ සෙසු අංශ විය. මූලික පිරිවෙන්වල භෞතික පහසුකම් සොයා බැලීමේ දී ඇතැම් පිරිවෙන්වල පන්ති කාලසටහන එල්ලීමට හෝ නිශ්චිත ස්ථානයක් නොමැති බව අනාවරණය විය. බොහෝ පිරිවෙන්වල ගුරුවරුන්ට හා ශිෂ්‍යයන්ට පන්ති කාමරයක් යනු නුහුරු අත්දැකීමක් බව ද අනාවරණය විය. පිරිවෙන් ශිෂ්‍යයන් පිළිබඳ ව ඉතා සංකීර්ණ ගැටලු රාශියක් ඇති බව ද අනාවරණය විය. ඒ අතර විවිධ පරිසරවල හැදුණු වැඩුණු විවිධ වයස් මට්ටම්වල සිසුන් එක පන්තියක එකට ඉගෙනීම සෑම පිරිවෙනක ම පොදු ලක්ෂණයක් බව අනාවරණය විය. ඒ තුළින් පන්තියේ ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී ගුරුවරයා ගැටලු රැසකට මුහුණ දෙන බව අනාවරණය විය.

පිරිවෙන් ගුරුවරුන් පිළිබඳ ගැටලු විමසා බැලීමේ දී අනාවරණය වූ කරුණු අතර බොහෝ පිරිවෙන් ගුරුවරුන්ට නිසි පුහුණුවක් හෝ ගැඹුරු විෂය දැනුමක් නොමැති බව පෙනී ගියේය. පන්තියේ පාඩම් ඉගැන්වීමට සූදානමකින් තොර ව යන පිරිවෙන් ගුරුවරයා නිසා සිසුන්ට සම්භාව්‍ය භාෂා ඉගෙනීම අප්‍රසන්න අත්දැකීමක් වී ඇති බව අනාවරණය විය. තව ද ශිෂ්‍යයා හඳුනා ගැනීම සම්බන්ධයෙන් පිරිවෙන් ගුරුවරුන් දුර්වල මට්ටමක සිටින බවත් ළමා මනෝවිද්‍යාව හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා ආදිය කළ පිරිවෙන් ගුරුවරුන් ක්ෂේත්‍රයේ දුර්ලභ බවත් මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය.

අධ්‍යයන අනාවරණ මත පහත සඳහන් යෝජනා ඉදිරිපත් කර ඇත.

- සම්භාව්‍ය භාෂා පිළිබඳ ව පවත්නා ඍණාත්මක ආකල්පය වෙනස් කොට ධනාත්මක ආකල්පය ඇති කිරීම සඳහා ජාතික මට්ටමින් සමාජ කථිකාවක් ඇති කිරීම
- සම්භාව්‍ය භාෂා පිළිබඳ ව ඇති ගුරු උපදේශක පුරප්පාඩු විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සම්පූර්ණ කොට ඔවුන්ට ඵලදායී පුහුණුවක් හා තෘප්තිමත් සේවා තත්ත්වයක් ද පහසුකම් ද ලබා දීම
- පිරිවෙන් ගුරුවරුන් හා පිරිවෙන් ගුරු උපදේශකවරුන් අතර අන්‍යෝන්‍ය අවබෝධය, සුහද බව රැඳෙන පරිදි ආකල්පමය වෙනසක් ඇති කිරීම
- පිරිවෙන් ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත පුහුණු වැඩමුළු අඛණ්ඩව සිදු කිරීම

- මූලික පිරිවෙන් විෂය මාලාව කාලීන අවශ්‍යතාව අනුව සංශෝධනය කිරීම හා විභාග පිළිබඳ ව සිසුන්ගේ හා ගුරුවරුන්ගේ විශ්වසනීයත්වය ඇති කිරීම

- මූලික පිරිවෙන්වල භෞතික සම්පත් දියුණු කිරීම

යන කරුණු යෝජනා කර ඇත. අවසන් වශයෙන් මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වැඩිදුර අධ්‍යයනයක් කිරීමට අවශ්‍ය වන පෙළඹුමක් ඇති කරවන ආකාරයේ අනාගත පර්යේෂණ යෝජනා කීපයක් ඉදිරිපත් කරන ලදි.